රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
# Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No. SA/MA/MA-02/Assets-2 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024.06. 28

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

## මූල්‍ය නොවන වත්කම් සඳහා ගිණුම් තැබීම

මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වරින් වර උපදෙස් හා මාර්ගෝපදේශ නිකුත් කර තිබියදීත් බහුතරයක් වාර්තාකරණ ආයතන එම මාර්ගෝපදේශ හා CIGAS යාවත්කාලීන කිරීම් සමඟ (Updates) නිකුත් කරන මාර්ගෝපදේශ ප්‍රකාරව මහා භාණ්ඩාගාරයට මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය විය. තව ද, සමහර වාර්තාකරණ ආයතන භාණ්ඩාගාරයට මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමට පෙර කේවළ වත්කම් වටිනාකම් හා පාලන ලෙජර් ගිණුම් ශේෂ සමඟ සංසන්දනය නොකරන බව ද නිරීක්ෂණය වී ඇත.

මීට අමතරව, 2023 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන වාර්තා විශ්ලේෂණය කිරීමේ දී මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ විෂමතා හා සමහර වාර්තාකරණ ආයතනවල මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂ වෙනස්කම් පිළිබඳව විගණකාධිපති විසින් විමසුම් කර ඇති බව නිරීක්ෂණය විය.

එම නිසා, අයිතම මට්ටමේ මූල්‍ය නොවන වත්කම් සමඟ පාලන ලෙජර ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමේ අරමුණෙන් මූල්‍ය නොවන වත්කම්වල නිරවද්‍යතාවය පවත්වා ගැනීම සඳහා සියලුම වාර්තාකරණ ආයතන විසින් 2024 වර්ෂය සඳහා මූල්‍ය නොවන වත්කම් ගිණුම්කරණය හා වාර්තා කිරීමට පහත සඳහන් ක්‍රියාපටිපාටියට අනුගත විය යුතු ය.

01. සෑම වාර්තාකරණ ආයතනයක් විසින්ම 2024 ජූනි මාසය සඳහා වත්කම් ගොනුව (Assets File) cigassummary@sad.treasury.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට ජූලි මස 15 වැනි දින හෝ ඊට පෙර එවිය යුතු ය.

02. සියලුම උප කාර්යාල දත්ත ඒකාබද්ධ CIGAS වැඩසටහන සමඟ ඒකාබද්ධ කළ යුතු අතර, වත්කම් ගොනුව භාණ්ඩාගාරය වෙත යොමු කිරීමට පෙර ප්‍රධාන කාර්යාලය මගින් CIGAS පද්ධතියෙන් නිර්මාණය කළ හැකි " අවසන් ගිණුම් වත්කම් වාර්තාවේ (Final Account Asset Report)" ශේෂයන් සමඟ පාලන ලෙජර ශේෂයන් එකඟවේ ද යන්න පරීක්ෂා කළ යුතු ය.

03. 2024 වර්ෂය සඳහා මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂ භාණ්ඩාගාරයට එවනු ලබන ඉහත වත්කම් ගොනු මත පදනම්ව CIGAS වෙබ් යෙදවුමෙහි යාවත්කාලීන කරනු ඇත. එම ආරම්භක

මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General-Tel.: +94 11 2484500/600 Ext.: 1149
Director General - Tel.: +94 11 2484728
Fax: +94 11 2484869
Fax: +94 11 2473856
Website: www.sad.gov.lk
e - mail : dgsa@sad.treasury.gov.lk

ශේෂ කිසිදු තත්ත්වයක් යටතේ වෙනස් කිරීමක් සිදුකරනු නොලබන අතර, 2024 වර්ෂය සඳහා භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල ද (භාණ්ඩාගාර මුද්‍රිත) එම ආරම්භක ශේෂ යාවත්කාලීන කරනු ඇත.

04. ඊට අමතරව, CIGAS පද්ධතියෙහි " අවසන් ගිණුම් වත්කම් වාර්තාව " සහ භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පාලන ගිණුම්වල ආරම්භක ශේෂ අතර වෙනස්කම් පවතින වාර්තාකරණ ආයතන අදාළ වෙනස්කම් නිවැරදි කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ජර්නල් සටහනක් එවිය යුතු ය. එම ජර්නල් සටහන්වල ස්කෑන් කරන ලද පිටපත bandara.gmiu@sad.treasury.gov;lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කළ යුතු ය.

05. 2024 ජූලි මාසයේ සිට සියලුම උප කාර්යාලවල වත්කම් ගොනු ඒකාබද්ධ කර උප කාර්යාල ඇතුළුව සියලුම වත්කම් ගොනුවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමෙන් පසු මාසික ගිණුම් සාරාංශ එවීම සිදුකල යුතු ය. මෙම සාරාංශවලින් වසර තුළ සිදුවන ගනුදෙනු (මිලදී ගැනීම්, බැහැර කිරීම්, මාරු කිරීම් හා ආරම්භක ශේෂ සඳහා එකතු කිරීම්) පමණක් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල දත්ත සඳහා යොදාගනු ඇත.

මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරනු ලබන මූල්‍ය නොවන වත්කම් අගයන්හි නිරවද්‍යතාවය පවත්වා ගැනීම සඳහා සියලුම වාර්තාකරණ ආයතන ඉහත සඳහන් ක්‍රියාපටිපාටි අනුගමනය කළ යුතු බව අවධාරණය කෙරේ.

ඩබ්.ඒ. සමන්ත් උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත:

01. විගණකාධිපති